# යුද්ධයේ ජය දෙමළ ජනයාට විමුක්තියක් විය හැකි ද?

**- ගාමිණී වියන්ගොඩ (රාවය)**

මේ පැනයට 'ඔව්' කියා පිළිතුරු දෙන කණ්ඩායම් දෙකක් ඇත. ඉන් එක පිරිසක අදහස වන්නේ, අද පවතින අර්බුදය මුළුමණින් ත්‍රස්තවාදී ප්‍රශ්නයක් බවත්, දෙමළාට ප්‍රශ්නයක් මේ රටේ නැති බවත් ය. එ බැවින් ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසු සිංහලයාට මෙන් ම දෙමළාට ද සහජීවනයෙන් එක රටක ජීවත් වීමට හැකි වනු ඇත. මෙ සේ සිතන පිරිස සමන්විත වන්නේ, ජාතික හෙළ උරුමය සහ ජනතා විමුක්ති පෙරමුණ වැනි දේශපාලන පක්ෂවලිනුත්, නලින් ද සිල්වා සහ ගුණදාස අමරසේකර වැනි විද්වතුන්ගෙනුත් ය.

දෙ වන කණ්ඩායමේ මතය වන්නේ, දෙමළ මිනිසාට ජාතියක් වශයෙන් ප්‍රශ්නයක් ඇති බව සැබෑවක් මුත්, ඊට අතිරේකව රට ඉදිරියේ ත්‍රස්තවාදී ප්‍රශ්නයක් ද ඇති බව ය. ජාතියක් වශයෙන් දෙමළ ජනතාව මුහුණදෙන ප්‍රශ්නය සඳහා දේශපාලනික විසඳුමක් දීමට නම්
ප්‍රථමයෙන් ත්‍රස්ත්‍රවාදී ප්‍රශ්නය හමුදාමය වශයෙන් විසඳා ගත යුතු බව මේ පිරිස පෙන්වා දෙති. ඉන් පසු, කොටි සංවිධානය නැති දෙමළ සමාජයට බලය විමධ්‍යගත කළ හැක. මේ මතය දරන සංවිධාන සහ අයවළුවන් අතර, වර්තමාන ආණ්ඩු බලය හොබවන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වය සහ එක්සත් ජාතික පක්ෂයේ, සමසමාජ-කොමියුනිස්ට් පැරණි වාමාංශයේ ඇතැම් නායක කොටස් සහ ඩග්ලස් දේවානන්ද, ආනන්දසංගරී වැනි දෙමළ නායකයන් ද, දයාන් ජයතිලක සහ වික්ටර් අයිවන් වැනි විද්වතුන් පමණක් නො ව, සරත් ෆොන්සේකා වැනි හමුදා ප්‍රධානීන් ද ඇත.

දකුණු රටේ සාමාන්‍ය ජනයාගෙන් බහුතරය මේ මොහොතේ වෙසෙන්නේ දෙ වන මතය සමග නො ව, පළමු මතය සමග ය යන්න මගේ මතය යි. එහෙත් ඔවුන්ට දෙ වන පිරිස සමග පහසුවෙන් අනන්‍ය විය හැක. හේතුව, දෙ වන කණ්ඩායමේ පූර්ව කොන්දේසියක් වන, එල්.ටී.ටී.ඊ ය පරදා ලබන 'යුදමය ජයග්‍රහණය' යම් දවසක අත්පත් කර ගත් පසු ප්‍රායෝගික ව ක්‍රියාවට නැගෙන්නේ ඔවුන් අදහස් කරන ප්‍රතිසංස්කරණ (දේශපාලන විසඳුම) නො ව, තමන් මෙ තෙක් කල් මෙ රටේ සමාජගත කිරීමට වෙහෙසුණු ප්‍රවාදය, එ නම්, දෙමළාට විශේෂ
ප්‍රශ්නයක් නැති වග දකුණේ සමාජය ඉබේ පසක් කර ගැනීම වනු ඇතැ යි පළමු කණ්ඩායම සිතන නිසා ය.

වර්තමාන යුද්ධය, දෙ වන කණ්ඩායමේ වර්තමාන දේශපාලන ව්‍යාපෘතිය

බවට පත් වුණේ, ඇත්ත වශයෙන් ම පළමු කණ්ඩායමේ අප්‍රතිහත සමාජ මැදිහත් වීම මත බව මේ අතර අප අමතක නො කළ යුතු ය. ජාතික හෙළ උරුමය සහ ජනතා විමුක්ති පෙරමුණ චන්ද්‍රිකා මැතිනිය ගේ දේශපාලනය තුළ ජනතාව අතර මතවාදීමය වශයෙන් ආකර්ශනීය ව්‍යාපාරයන් බවට පත් නො වන්නට, අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට යුද්ධයක් දියත් කිරීම පහසු නො වන්නට හොඳට ම ඉඩ තිබුණි. එ බැවින්, මේ යුද්ධයේ සැබෑ නිර්මාපකයන් වන්නේ චම්පික රණවක සහ විමල් වීරවංශ වැන්නන් මිස, ජනාධිපති මහින්ද රාජපක්ෂ වත්, හමුදාපති සරත් ෆොන්සේකා වත් නො වෙති.

කෙ සේ වෙතත් මේ ලිපියෙන් සාකච්ඡා කිරීමට උත්සාහ කරන්නේ දෙ වන පිරිසේ ආස්ථානය යි.
මේ අයගෙන්, වර්තමාන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වය සහ එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් නායක කොටස් හැරුණු කොට ඉතිරි පිරිස, තමන් වටහාගෙන ඇති ප්‍රශ්නයට පිළිතුරක් මේ යුද්ධය හරහා එළිපෙහෙළි වනු ඇතැ යි අව්‍යාජව විශ්වාස කරනවා විය හැක. එහෙත් ඔවුන් අමතක කරන හෝ ඔවුන්ට ග්‍රහණය නො වන වැදගත් කාරණයක් තිබේ. එ නම්, වර්තමාන යුද වැයම වනාහී දෙමළ ජනයාට විසඳුමක් ඉදිරිපත් කිරීමේ සද් ප්‍රයත්නයකට වඩා, දේශපාලනයේ පුද්ගල බල ව්‍යාපෘතියක අංගයක් වීමට හොඳට ඉඩ ඇති බව යි.

අද අපේ සමාජය භේදභින්න වී ඇති තරම අනුව, ආණ්ඩුවේ යුදමය ජයග්‍රහණයක් උතුරු නැගෙනහිර ජනයා කෙරෙහි දෙයාකාරයකින් සනිටුහන් වනු ඇත. එකක් වන්නේ, කොටි සංවිධානයේ යුදමය පරාජය පිළිබඳව දෙමළ ජනයා අතරේ ආරම්භයේ දී ඇති විය හැකි වික්ෂිප්තයයි. ඔවුන් තෝන්තුමාන්තු විය හැක. ව්‍යාකූල විය හැක. දෙ වැන්න වන්නේ, තමන් ජාතියක් වශයෙන් පරාජය කරනු ලැබිණැ'යි ඇති වන අවමාන සහගත සාමූහික හැඟීම යි. එ සේ වන්නේ, පසු ගිය දශක පහකට වැඩි කාලයක් තිස්සේ එක පැත්තකින් ලංකා ආණ්ඩුව සහ දකුණේ සිංහල සමාජය අනන්‍ය වී තිබීමත්, අනිත් පැත්තෙන් පසු ගිය දශක දෙකකට අධික කාලයක් තිස්සේ කොටි සංවිධානය සහ දෙමළ බහුතරය අනන්‍ය වී තිබීමත් නිසා ය. රජයේ යුද ජයග්‍රහණයක් සිංහලයා ගේ ගැලවීමක් වශයෙන් ගැනීමට දකුණේ සමාජය පෙළඹෙනු ඇත්තේ යම් සේ ද, කොටි සංවිධානයේ විනාශය දෙමළ සමාජයේ ඓතිහාසික පරාජයක් සහ අවමානයක් වශයෙන් ගැනීමට උතුරේ සමාජයත් යුහුසුළු වනු ඇත.

ඉහත කී දෙ වන කණ්ඩායමට මේ ප්‍රශ්නය සඳහා ප්‍රතිකර්මික ඔසුවක් ඇත. එ නම්, දකුණේ ආණ්ඩුව යුද්ධය දියත් කෙළේ ම, දේශපාලන විසඳුමක ඉදිරි

දර්ශනය යටතේ නිසා, යුද ජයග්‍රහණයෙන් පසු දෙමළ ජනතාව වෙනුවෙන් දකුණෙන් සැපයෙන 'පැකේජය' තුළින්, යුද පරාජය විසින් උතුරේ ජනිත කැර විය හැකි ඉහත කී අපේක්ෂා භංගත්වය සහ ජාතික අවමානය සමහන් කෙරෙනු ඇති බව ය.
මේ දක්වා, අතීත ප්‍රශ්නය සහ අනාගත පිළිතුර පැහැදිලි ය.

එහෙත් එම පිළිතුර ස්වප්න තලයක නො ව, ප්‍රායෝගික තලයක කෙ තෙක් දුරට වලංගු වේ ද යන්න සෙවිය යුතු ව ඇත්තේ, දෙමින් තිබෙන ප්‍රතිඥා හරහා නො ව, පසු කර ආ ඉතිහාසයත්, ගත කරන වර්තමානයත් හරහා සැපයෙන සංඥා තොරතුරු සහ දත්ත මත ය.

කොටි සංවිධානයක් නො තිබුණු සහ ත්‍රස්තවාදයක සෙවණැල්ලක් වත් නො තිබුණු දශක තුනකටත් වැඩි දෙමළ අරගළ ඉතිහාසයක් අපේ නිදහසෙන් පසු කාලය තුළ අප අත්දැක ඇත. එ දා දෙමළ අරගළය ප්‍රජාතන්ත්‍රවාදී ය. සාමකාමී ය. කොටින් ම, ගාන්ධිවාදී ය. ඒ ගාන්ධිවාදී දීර්ඝ කාල පරිච්ඡේදය තුළ අඩු වශයෙන් දෙමළ ජාතියට තමන් ගේ ම වන සුවිශේෂ ප්‍රශ්නයක් ඇති බව පවා දකුණ ලවා පිළිගැන්වීමට හැකියාවක් ලැබුණේ නැත. පළමු වරට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය දෙමළ ජාතියට සුවිශේෂ වූ ප්‍රශ්නයක් ඇති බව පිළිගන්නේ, 1980 දශකය අවසානයේ දී ය. ඒ, චෙල්වනායගම් ගේ හෝ අමිර්තලිංගම් ගේ බැගෑපත් ඉල්ලීම මත නො ව, කොටි සංවිධානයේ ප්‍රචණ්ඩ තෙරපීම මත යි.
එ සේ ම, ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් දේශපාලනික වශයෙන් බලය විමධ්‍යගත කිරීමේ අවශ්‍යතාවය සිංහල දකුණට ඒත්තු ගැන්වීම සඳහා ඉහත කී ගාන්ධිවාදී, සාමකාමී දෙමළ නායකත්ව, අඩු වශයෙන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල සිට දශක පහක කාලයක්වත් උද්ඝෝෂණ කර ඇත. ඒ උද්ඝෝෂණ කිසි යම් සාර්ථකත්වයක් කරා ළඟා වෙමින් තිබූ 1958 දීත් (බණ්ඩාරනායක-චෙල්වනායගම්), 1967 දීත් (ඩඩ්ලි-චෙල්වනායගම්), ආපසු හැරවිය නො හැකි වන සේ ඒ ප්‍රයත්නයන් තීරණාත්මක ලෙස පරාජය කිරීමට දකුණ වගබලා ගත්තේ ය. ඒ කාලයේ කොටි සංවිධානයක් හෝ ත්‍රස්තවාදයක් රටේ තිබුණේ නැත. කෙ සේ වෙතත්, මේ
ප්‍රධාන කාරණා දෙක ම, එ නම් 'දෙමළාට සුවිශේෂ වූ ප්‍රශ්නයක් ඇති බව' සහ ඒ හේතුවෙන් 'බලය විමධ්‍යගත කිරීමක ඇති අවශ්‍යතාව' 1990 දශකය වන විට ප්‍රතිපත්තිමය වශයෙන් දකුණ පිළිගත්තේ ය. ඒ, කොටි සංවිධානයේ ප්‍රචණ්ඩ තෙරපීම මත ම පමණි.

(ඉතිරිය ඊ ළඟට)